AL/2016/41/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ட்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය I<br>பௌத்தம் I<br>Buddhism I | 41 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** යි.

**1.** පසුගිය වෙසක් පුරපසළොස්වක පොහොය නිමිති කොට අප විද්‍යාලයේ බෞද්ධ ශිෂ්‍ය සංගමයේ සංවිධානයෙන් බෞද්ධ මූර්ති දැක්මක් පවත්වන ලදී. එහි බුද්ධ ප්‍රතිමා ඇතුළත් කුටියක් ද තිබිණි. එම කුටියේ වැකියකින් බුදුරදුන් සමකාලීන ශාස්තෘවරුන් අතර සුවිශේෂ වන්නේ කෙසේ දැ'යි දක්වා තිබිණි. එම වැකිය කුමක් ද?

(1) නවීන විද්‍යාවට සපුරා එකඟ වන දහමක් දේශනා කිරීම
(2) සීමාවකින් තොරව සිතීමට හා විමසීමට නිදහස ලබා දීම
(3) "තම දහම ම සත්‍ය ය, සෙසු සියල්ල අසත්‍ය ය යැ'යි" නොපැවසීම
(4) සීලය විමුක්ති ලාභයට ඇති එක ම පිළිවෙත බව පෙන්වා දීම
(5) තර්කානුකූල ව ධර්ම කරුණු ඉදිරිපත් කර තිබීම

**2.** බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව මහායානිකයන් මෙන් ම හීනයානිකයෝ ද පසුකාලීනව විවිධ අදහස් දැරූහ. ඒ අනුව උන්වහන්සේ අතිමානුෂික දේවාතිදේව උතුමකු ලෙස ඇතැම් විට පිළිගන්නා ලදී. එහෙත් වඩාත් පැරණි පාලි නිකාය ග්‍රන්ථවලින් පැහැදිලි වන්නේ,

(1) උන්වහන්සේ සතුව ත්‍රිවිධ කායක් තිබූ බව ය.
(2) උන්වහන්සේට විටින් විට පිපාසය ඇති වූ බව ය.
(3) පුරිසදම්ම සාරථී ගුණයෙන් යුක්ත වූ නිසා මනුෂ්‍යත්වය ඉක්මවා සිටි බව ය.
(4) කිසිදු රෝගාබාධයක් නොවැළඳුණු බව ය.
(5) යමාමහ පෙළහර පෑමේ හැකියාව ඇති නිසා බුදු බව දේවත්වයට සම වන බව ය.

**3.** බාවරී සියලු සම්පත් හැර නදී තෙරක අසපුවක් තනාගෙන සිටි බමුණෙකි. ඔහුට සත්‍ය ගවේෂී තරුණ අනුගාමිකයෝ සොළොසක් සිටිය හ. බුදුරදුන් පිළිබඳ තොරතුරු දැන ගත් හෙතෙම උන්වහන්සේගේ සිරුරෙහි විශේෂ ලක්ෂණ දෙතිසක් තිබේ දැ'යි සොයා බැලීමට එම සිසුන් පිටත් කර හැරියේ ය. එම ලක්ෂණ අතුරෙන් එකක් නම්,

(1) සිංහයකුගේ මෙන් පිරුණු හකු පෙදෙසක් ඇති බව ය.
(2) අටළොස් රියන් උස සිරුරක් ඇති බව ය.
(3) ප්‍රමාණයෙන් එක් බඳු දත් දෙතිසක් ඇති බව ය.
(4) දෙකන්හි දිගු බව හා අගින් සිදුරු ඇති බව ය.
(5) අකනිටා බඹලොව දක්වා විහිද යන ස්වරයක් ඇති බව ය.

**4.** විජ්ජාචරණ සම්පන්න යනු බුදුගුණයකි. නව අරහාදි බුදුගුණවලට ඇතුළත් වන එම ගුණයෙන් ප්‍රකාශ වන්නේ බුදුරජාණන් වහන්සේ අෂ්ට විද්‍යාවකින් හා පසළොස් චරණයකින් යුක්ත වන බව ය. එකී පසළොස් චරණ ධර්මයන්ගෙන් එකක් **නො වන්නේ,**

(1) ඉන්ද්‍රිය සංවරයයි.
(2) තාදි ගුණයයි.
(3) ජාගරියානුයෝගයයි.
(4) ප්‍රථම ධ්‍යානයයි.
(5) වීර්යයයි.

**5.** බුදුරජාණන් වහන්සේ මෙන් ම මහරහතුන් වහන්සේ ද සසර දුකින් එතෙර වූ උතුමෝ ය. විමුක්තිලාභී වූ එතුමෝ ඇත්ත ඇති සැටියෙන් දැන දැක ගත්හ. එහෙත් බුදුරදුන්ට පමණක් ඇති රහතුන් වහන්සේලා වෙත නැති ඥානාධිගමයෝ ද වෙත්. ඉන් එකක් නම්,

(1) ඉද්ධිවිධ ඥානයයි.
(2) අනුමාන ඥානයයි.
(3) ආකාසානඤ්චායතන ඥානයයි.
(4) විපස්සනා ඥානයයි.
(5) ඉන්ද්‍රියපරොපරියත්ති ඥානයයි.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

6. එක් සමයෙක බුදුරජාණන් වහන්සේ අනඳ තෙරණුවන්ගේ ඉල්ලීම පරිදි රම්මක බමුණු අසපුවට වැඩම කළ හ. එහිදී ධර්ම ශ්‍රවණය කැමති වූ භික්ෂූන්ට චතුරංග සමන්නාගත වීර්යයෙන් යුක්තව තමන් වහන්සේ විමුක්ති ගවේෂණයට කැපවූ අන්දම විස්තර කොට ඇත්තේ,
(1) විමොක්ඛ සූත්‍රයේ ය. (2) අරියපරියේසන සූත්‍රයේ ය.
(3) මහාවග්ගපාලි වත්තක්ඛන්ධකයේ ය. (4) මහාහත්ථිපදෝපම සූත්‍රයේ ය.
(5) වීමංසක සූත්‍රයේ ය.

7. ධර්මරත්නයේ සැවැදෑරුම් ගුණ නිවැරදි ව ලියා කෙටි තේරුම් දක්වන්න යැ'යි ලොකු හාමුදුරුවෝ ස්වකීය ශිෂ්‍ය සාමණේර හිමියන්ට පැවරුමක් දුන්හ. එහි දී උන්වහන්සේ විසින් සන්දිට්ඨික යන්නට දී තිබූ නිවැරදි අර්ථය නම්,
(1) සමානාත්මතාවාදී දැක්ම ඇති යන්නයි. (2) මෙලොව දී ම නුවණැසින් දැක ගත යුතු යන්නයි.
(3) සම්‍යක් දෘෂ්ටික බව යන්නයි. (4) සත්තානයෙහි දියුණුව ඇති කරන දැක්ම යන්නයි.
(5) සැක සංකා සියල්ල දුරු කරන යන්නයි.

8. බුදුදහම ලෝකයේ එදා මෙදා තුර පහළ වූ සමය වාද අතර සුවිශේෂත්වයක් ගන්නා බව තහවුරු කිරීමට ඉදිරිපත් කළ හැකි කරුණු රැසක් තිබේ. මූලික ඉගැන්වීම්වලින් හෙළිවන එම කරුණු අතුරෙන් එකක් ලෙස සැලකිය **නො හැක්කේ,**
(1) තර්කනයෙන් යථාර්ථය දත නොහැකි බව ඉගැන්වීමයි.
(2) දෙවිදේවතා සංකල්ප සපුරා බැහැර කිරීමයි.
(3) මානව කේන්ද්‍රීය ධර්ම මාර්ගයක් වීමයි.
(4) ආචාර විද්‍යාත්මක දර්ශනයක් වීමයි.
(5) නිත්‍යාත්ම සංකල්පය පදනම් කර නොගැනීමයි.

9. භාග්‍යවතුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට නිදහස දුන්නේ "සෑම පුද්ගලයකු ම තමා ගැන වග කිව යුතු ය" යන අදහස මුල් කරගෙන ය. භික්ෂු සමාජයේ පූර්ණ බලය ඇති වගකිවයුත්තා තමන් වහන්සේ යැ'යි අදහස් නොකළ බව ද පෙනේ. එය පැහැදිලි වන ධර්ම පාඨය කුමක් ද?
(1) ධම්ම දායාදා හොථ භික්ඛවෙ මා ආමිස දායාදා (2) සුඛා සංඝස්ස සාමග්ගී
(3) අත්තාහි අත්තනො නාථො (4) න මමනුද්දෙසො භික්ඛු සංඝො
(5) කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි

10. පෙළ දහමේ හමු වන "මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති" තථාගතයන් වහන්සේ පවත්වන්නේ මධ්‍යම දේශනාවකි, යන්නෙන් අර්ථවත් වන්නේ,
(1) කාමසුඛල්ලිකානුයෝගයත් අත්තකිලමථානුයෝගයත් බැහැර කෙරෙන බව ය.
(2) උන් වහන්සේ උපේක්ෂාවෙන් ධර්මය දේශනා කරන බව ය.
(3) බුදුදහම සමානාත්මතාව අගය කරන බව ය.
(4) මෙලොව දියුණුව මෙන් ම පරලොව දියුණුව ද වර්ණනා කරන බව ය.
(5) ශාස්වත අශාස්වත යන උභයාන්තයට ම නොවැටී දහම් දෙසන බව ය.

11. තමන් වහන්සේ අනේක පරියායෙන් (නොයෙක් ක්‍රමවලින්) දහම් දෙසන බව බුදුරදුන් ප්‍රකාශ කර ඇත. උන්වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කළ බොහෝ දෙනා ද ඒ බව පවසා තිබේ. එම දේශනා පරියාය අතර අත්තූපනායික යන්නෙන් අදහස් කෙරෙනුයේ,
(1) තමන් උපමා කොට අනුන් පෙළීමෙන් වැළකීම යන්නයි.
(2) ආත්මාර්ථකාමී ව ක්‍රියා නොකළ යුතු ය යන්නයි.
(3) ආත්මවාදය උපමාවට නොගත යුතු බවයි.
(4) තමන් ම උසස් යැ'යි නොසැලකීම යන්නයි.
(5) පින් කිරීමෙන් මතු ආත්මය සැපවත් වේ යන්නයි.

12. "සෙය්‍යථාපි නාම පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති. සපත්තභාරොව ඩෙති. එවමෙව භික්ඛු සන්තුට්ඨෝ හොති." යන ධර්ම පාඨයෙන් ප්‍රකාශ වන්නේ භික්ෂූන් වහන්සේලා,
(1) සැප සේ විසිය යුතු බව ය. (2) සැහැල්ලු ගති පැවතුම් ප්‍රකට කළ යුතු බව ය.
(3) සාමාන්‍ය මිනිසුන්ට වඩා ඉහළින් සිටින බව ය. (4) "උසස් පිළිවෙත් රකින්නේ ය" යන්න ය.
(5) සමාජයට ආදර්ශමත් විය යුතු බව ය.

13. විනය මහාවග්ගයෙහි සඳහන් වන පරිදි ගණපූරණය සහිත ව රැස් වූ උපසපන් භික්ෂූන්ගේ සභාවක දී සාමණේර භික්ෂුවක් උපසම්පදා කළ යුත්තේ කුදුසක් වූ අන්තරායකර ධර්ම ඇද්දැ'යි විමසීමෙන් පසුව ය. ඉන් එකක් **නො වන්නේ,**
(1) ණයකාරයෙකු වීම යන්න ය. (2) විරූපී පුද්ගලයකු වීම යන්න ය.
(3) මාපිය අවසරය නොලැබීම යන්න ය. (4) දාසයකු වීම යන්න ය.
(5) පංචාබාධවලින් එකක් වැළඳී තිබීම යන්න ය.

14. සාමණේර යනු, පුහුණුවන පැවිද්දා, ආධුනික භික්ෂුව, ශ්‍රමණයාගේ පුත්‍රයා යන අර්ථ ඇති ශාසනික ව්‍යවහාරයකි. භික්ෂුත්වයෙන් ළදරු වූ අනුපසම්පන්න භික්ෂුව ඉන් අර්ථවත් වේ. උන්වහන්සේට අදාළ ශික්ෂණයට ඇතුළත් **නො වන්නේ,**
(1) දස සික්ඛා ය. (2) දස පරිජි ය.
(3) දස නාසනා ය. (4) දස දඬුවම්වත් ය.
(5) දස පින්කිරියවත් ය.



Department of Examinations Sri Lanka

15. උපසම්පදා භික්ෂුත්වය සුරක්ෂිත වන්නේ ප්‍රාතිමෝක්ෂයෙහි ඇතුළත් මූලික ආපත්ති සතරකට නොපැමිණීමෙනි. පාරාජිකා නම් වූ එම ආපත්ති පිළිබඳ පහත දැක්වෙන විවරණ අතුරෙන් නිවැරදි වන්නේ එකක් පමණි. එනම්,
(1) පාරාජිකාවෝ ඡෙජ්ජගාමිණී ඇවැත් ගණයට වැටෙති.
(2) එක් පාරාජිකයකට පැමිණීමෙන් භික්ෂුත්වය අහිමි නො වේ.
(3) පාරාජිකාපත්තියකට පත් භික්ෂුවට සංඝයාගෙන් සමාව ගත හැකි ය.
(4) සාමණේරයකු ලෙස ක්‍රියා කිරීමට පාරාජිකාපත්තියකට පත් භික්ෂුවකට නොහැකි ය.
(5) එම ඇවැතට පැමිණි භික්ෂුවට නැවත උපසම්පදා විය හැකි ය.

16. භික්ෂු සමාජය තුළ ගුරුවරුන් හා ශිෂ්‍යයින් අතර තිබිය යුතු ආධ්‍යාත්මික හා බාහිර බැඳීමත්, ඔවුනොවුන් වෙනුවෙන් ඉටු විය යුතු යුතුකම්, වගකීම් ආදියත් සවිස්තර ව දක්වා ඇත්තේ,
(1) චුල්ලවග්ගපාළියේ ය.
(2) සිගාලෝවාද සූත්‍රයේ ය.
(3) වත්තක්ඛන්ධකයේ ය.
(4) භික්ෂුප්‍රාතිමෝක්ෂයේ ය.
(5) සේඛියාවල ය.

17. අප විහාරස්ථානයේ පවත්වාගෙන යන විහාර මහාදේවි කුළඟන සමිතිය මගින් පසුගිය පෝදා විශේෂ දහම් හමුවක් පවත්වන ලදී. එහි මාතෘකාව වූයේ "බුදුරජාණන් වහන්සේ විසින් අගතනතුරු ප්‍රදානය කරන ලද උපාසිකාවෝ" යන්නයි. ඛුජ්ජුත්තරා උවැසියට හිමි වූ අගතනතුර පිළිබඳ ව විවිධ අදහස් එහි දී පළ වූ අතර ඉන් නිවැරදි වූයේ,
(1) ගිලනුන්ට උවටැන් කරන උවැසියන් අතර අගතනතුර යන්න ය.
(2) විශ්වාස කටයුතු දේ කියන උවැසියන් අතර අගතනතුර යන්න ය.
(3) ධ්‍යාන වඩන උවැසියන් අතර අගතනතුර යන්න ය.
(4) මෛත්‍රී විහරණ ඇති උපාසිකාවන් අතර අගතනතුර යන්න ය.
(5) බහුශ්‍රැත උපාසිකාවන් අතර අගතනතුර යන්න ය.

18. සිවුවණක් ශ්‍රාවක පිරිස අතර උපාසකවරුන්ට ද ශාසනය තුළ සුවිශේෂ තැනක් හිමි වේ. විශේෂ කුසලතා සැලකිල්ලට ගනිමින් බුදුරජාණන් වහන්සේ විසින් ඔවුන්ට විවිධ අගතනතුරු පිරිනමා තිබේ. ඒ අනුව ධර්මකථික උවසුවන් අතර අග්‍රස්ථානය හිමි වූයේ,
(1) මහානාම ශාක්‍ය පුත්‍රයාට ය.
(2) චිත්ත ගෘහපතියාට ය.
(3) සුදත්ත සිටුතුමාට ය.
(4) ජෝතිපාල මානවකයාට ය.
(5) ජීවක වෛද්‍යවරයාට ය.

19. බුදුරජාණන් වහන්සේ විසින් ස්වකීය ශ්‍රාවක ශ්‍රාවිකාවන් ධර්ම ප්‍රචාරයෙහි ලා උනන්දු කරවීම පිළිබඳ ව සඳහන් **නො වන** මූලාශ්‍රයක් වන්නේ,
(1) මහාපරිනිර්වාණ සූත්‍රයයි.
(2) සද්ධම්මසම්මෝස සූත්‍රයයි.
(3) ධම්මකථික සූත්‍රයයි.
(4) අස්සලායන සූත්‍රයයි.
(5) මහාවග්ගපාළියයි.

20. බුදුරදුන් ධරමාන අවධියේ දී පවා අධර්මවාදී අවිනයවාදී ශ්‍රාවකයන් සිටි බවත් ඔවුන් විසින් යම් යම් විෂම අදහස් ඉදිරිපත් කොට ඇති බවත් සූත්‍ර හා විනය මූලාශ්‍රය තුළින් පැහැදිලි වේ. එවැනි අවස්ථාවක් ලෙස සැලකිය **නො හැක්කේ,**
(1) විනයධර භික්ෂූන් ධර්මධර භික්ෂූන්ට චෝදනා කිරීමයි.
(2) සාති භික්ෂුව විසින් අනන්‍ය වූ භව සංක්‍රමණික විඥානයක් ඇතැයි පැවසීමයි.
(3) අන්තරායික ධර්ම එසේ නොවේ යැ'යි අරිට්ඨ භික්ෂුව කළ ප්‍රකාශයයි.
(4) සැරියුත් මුගලන් දෙනමට තනතුරු ප්‍රදානය කිරීමෙන් පසුව ඇතැම් භික්ෂූන් බුදුරදුන්ට චෝදනා කිරීමයි.
(5) මහාප්‍රජාපතී ගෝතමියට පැවිද්ද ලබා දෙමින් බුදුරදුන් ඥාතිසංග්‍රහයක් කළ බවට ඇතැමුන් හඬනැගීමයි.

21. ප්‍රථම ධර්ම සංගීතිය පැවැත්වීමට තුඩු දුන් එක ම හේතුව ලෙස සාම්ප්‍රදායික මූලාශ්‍රය සඳහන් කරන්නේ සුභද්‍රගේ ප්‍රකාශයයි. ඒ අසා සංවේගයට පත් මහාකාශ්‍යප මාහිමියන් සංගීතියක් පැවැත්වීමට යෝජනා කළ බව සඳහන් වේ. එසේ වුව ද පළමු සංගීතිය පැවැත්වීමට අවශ්‍ය පසුබිම ඒ වන විට සැකසී තිබූ බව නොයෙක් කරුණුවලින් පෙනේ. ඉන් එක් කරුණක් **නො වන්නේ** කුමක් ද?
(1) පිරිසිදු ධර්ම විනය පිළිබඳ ව එකඟත්වයක් ඇති කර ගැනීමේ අවශ්‍යතාව
(2) ඇතැම් රජදරුවන් ශාසනික තත්ත්වය ගැන කලකිරී සිටීම
(3) ආනඳ මහතෙරුන් වහන්සේට විරුද්ධව තිබූ චෝදනා සලකා බැලීම
(4) ඛුද්‍රා-අනුඛුද්‍රා ශික්ෂා පද කවරේ දැ'යි විනිශ්චය කිරීම
(5) ධර්ම විනය පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

22. ථෙරවාද නොවන සාහිත්‍යමය මූලාශ්‍රය අනුව රහතුන් වහන්සේගේ ස්වභාවය පිළිබඳ ව මතවාද පහක් පරිනිර්වාණයෙන් සියවසක් ඉක්ම යද්දී පැතිර ගොස් තිබිණි. ඉන් එකක් ලෙස සැලකිය හැක්කේ,
(1) රහතුන් වහන්සේ චතුරාර්ය සත්‍යය අවබෝධ කරගෙන නැත යන්නයි.
(2) උන්වහන්සේ තුළ රාගය තිබිය හැකිය යන්නයි.
(3) රහතුන් වහන්සේට මරණින් පසු පැවැත්මක් නැත යන්නයි.
(4) උන්වහන්සේ තුළ විචිකිච්ඡාව නැත යන්නයි.
(5) උන්වහන්සේගේ ධර්මාවබෝධය අසම්පූර්ණ ය යන්නයි.



Department of Examinations Sri Lanka

3716

**23.** තෙවන ධර්ම සංගීතිය ශාසන ඉතිහාසය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ ඓතිහාසික සිද්ධියකි. එය පැවැත්වීමට ජ්‍යෙෂ්ඨ ථෙරවාද භික්ෂූන් පෙලඹී ඇත්තේ කරුණු රාශියක් නිසා ය. ඉන් එක් කරුණක් **නො වන්නේ,**
(1) දේශාන්තර වශයෙන් ථෙරවාද ධර්මය ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවයි.
(2) ශාසන විරෝධී ශ්‍රමණ වේශධාරීන් මර්ධනය කිරීමයි.
(3) බෞද්ධ නිකාය අතර බිහි වී තිබූ මතවාදවලට නිසි පිළිතුරු සැපයීමයි.
(4) මහායාන අදහස් දැරූ භික්ෂූන් සසුනෙන් නෙරපීමයි.
(5) ථෙරවාද භික්ෂූන්ගේ සංවිධානය වඩාත් ශක්තිමත් කර ගැනීමයි.

**24.** භික්ෂු ප්‍රාතිමෝක්ෂයට ඇතුළත් වන්නේ කුමන ශික්ෂාවන් දැ'යි පිරිවෙන් ශිෂ්‍යයකු විසින් විනයාචාර්ය ස්වාමීන් වහන්සේ නමකගෙන් විමසන ලදී. උන්වහන්සේ දුන් නිවැරදි පිළිතුරට ඇතුළත් **නො වූයේ,**
(1) සතර පාරාජිකා ය.
(2) දස ශික්ෂා පද ය.
(3) තෙලෙස් සංඝාදිසේස ය.
(4) අධිකරණ සමථ ය.
(5) පාටිදෙසනීය ය.

**25.** අභිධර්මය යනු කුමක් ද යන්නට පුරාණාචාර්යවරුන් විසින් විවිධ නිර්වචන සපයා තිබේ. ඉන් එකක් වන්නේ,
(1) "අරුත් හෙළි කළ බැවින් අභිධම්ම නම් වේ" යන්නයි.
(2) "නොයෙක් විශේෂ නය ක්‍රම ඇති බැවින් අභිධම්ම නම් වේ" යන්නයි.
(3) "මැනවින් ප්‍රකාශ කරන ලද ධර්මය අභිධර්මය වේ" යන්නයි.
(4) "අතිරේක ධර්මය යන අර්ථයෙන් අභිධර්මය යැ'යි කියනු ලැබේ" යන්නයි.
(5) "සමාජය පිළිබඳ ගැඹුරු විග්‍රහයක් ඇතුළත් වන බැවින් අභිධර්මය නම් වේ" යන්නයි.

**26.** වෛදික බ්‍රාහ්මණයන් විසින් උගන්වන ලද ස්වධර්ම න්‍යාය අනුව වෛශ්‍යයකුගේ කාර්යභාරයන් මොනවා දැ'යි අප විදුහලේ පසුගිය වාර පරීක්ෂණයේ දී 13 වන ශ්‍රේණියේ බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රයෙහි අසා තිබිණ. එයට එක් සිසුවකු දී තිබූ පිළිතුරෙහි එක් කරුණක් නිවැරදි **නොවී ය.** එය කුමක් ද?
(1) යාගහෝම කිරීම
(2) ශාස්ත්‍ර හැදෑරීම
(3) බ්‍රහ්මචාරී වීම
(4) මුදල් ණයට දීම
(5) ගොවිතැන් කටයුතු කිරීම

**27.** පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් බුදුරදුන් විසින් විචාරයට ලක් කරන ලද බව ප්‍රකට ය. මිනිස් සංහතියේ ඒකත්වය තහවුරු කළ එබඳු සූත්‍ර දේශනාවක් වන්නේ,
(1) පාථික සූත්‍රයයි.
(2) ජීවක සූත්‍රයයි.
(3) කණ්ණකත්ථල සූත්‍රයයි.
(4) මහාපදාන සූත්‍රයයි.
(5) සෙඛ සූත්‍රයයි.

**28.** "සියල්ල අහේතුක ය, අප්‍රත්‍යක ය, පූර්ව නිශ්චිත ය, පුද්ගලයා විසින් සිතාමතා කළ යුත්තක් නැත" යන වාදය ඉදිරිපත් කළේ,
(1) සංජය බෙල්ලට්ඨි පුත්ත ය.
(2) සච්චක පඬිවරයා ය.
(3) ජෛන මහාවීරතුමා ය.
(4) මක්ඛලීගෝසාල ය.
(5) වච්ඡගොත්ත පරිබ්‍රාජකයා ය.

**29.** මූලික බෞද්ධ ඉගැන්වීමක් වන ත්‍රිලක්ෂණය පිළිබඳ ව ලියන ලද එක්තරා විස්තරයක සඳහන් වූ කරුණු අතුරෙන් එකක් නිවැරදි **නොවී ය.** එනම්,
(1) උපාදානස්කන්ධ පහ ම ත්‍රිලක්ෂණ ස්වභාවයෙන් යුක්ත ය.
(2) සංඛත ධර්මයෝ ත්‍රිලක්ෂණයෙන් තොර වෙති.
(3) විදර්ශනා භාවනාව යනු ත්‍රිලක්ෂණ භාවනාවයි.
(4) අස්මිමානය දුරු කිරීමට අනිච්ච සංඥාව වැඩිය යුතු ය.
(5) දුක් සහිත ධර්ම අනාත්ම වේ.

**30.** ගිහි සමාජය තුළ පැවතිය යුතු අඹු-සැමි සම්බන්ධය සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරයෙහි දක්වා ඇති කරුණු ඇසුරෙන් පැහැදිලි කරමින් ශිෂ්‍යයකු විසින් බෞද්ධ සංගමය අමතා දේශනයක් කරන ලදී. එහි දී එක් කරුණක් ඔහු විසින් දක්වන ලද්දේ **වැරදියට** ය. එය නම්,
(1) බිරිඳ සැමියාට සම්මාන කළ යුතු ය යන්නයි.
(2) සැමියා බිරිඳට යස ඉසුරු පවරා දිය යුතු ය යන්නයි.
(3) සැමියා බිරිඳට අවමන් නොකළ යුතු ය යන්නයි.
(4) බිරිඳ සැමියාගේ හිතවතුන්ට සංග්‍රහ කළ යුතු ය යන්නයි.
(5) සැමියා බිරිඳට ආභරණ ආදිය රැගෙන දිය යුතු ය යන්නයි.

**31.** බුදුදහම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නැති එහෙත් බෞද්ධ ඉගැන්වීම පිළිබඳ විවරණ සපයන ඇතැම් විචාරකයන් පවසන්නේ බුදුසමය අසුභවාදී වන බව ය. දුක්ඛාර්ය සත්‍යය පිළිබඳ බුද්ධ දේශනාව ඔවුහු උපුටා දක්වති. එයට දිය යුතු නිසි පිළිතුරක් ලෙස සැලකිය **නො හැක්කේ,**
(1) "සසර දුක් සහිත යැ'යි වදාළ නමුදු එහි සැපයක් නැතැයි ඉන් නොකිය වේ" යන්නයි.
(2) "වීර්යය හා උත්සාහාය තුළින් දුක් නිම කළ හැකි යැ'යි උගන්වන බැවින් බුදුදහම අසුභවාදී නො වේ" යන්නයි.
(3) "දුක්ඛාර්ය සත්‍යයෙන් කියැවෙන්නේ සුභවාදයක් හෝ අසුභවාදයක් නොව යථාර්ථවාදයකි" යන්නයි.
(4) "අසුභ වශයෙන් ලෝකය දෙස බලන්න යැ'යි බුදුරජාණන් වහන්සේ නොවදාළහ" යන්නයි.
(5) "දුකින් මිදීමේ මග ද දක්වා ඇති බැවින් අප අසුභවාදී ව පසුගාමී නොවිය යුතු ය" යන්නයි.

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

32. සසර දුක් උපදිනුයේ හේතුප්‍රත්‍ය ඇතිව ය. ඒ අතර මූලික වන්නේ මිනිස් සන්තානගත ව ඇති තණ්හාවයි. ත්‍රිවිධ ප්‍රභේදයකින් දක්වා ඇති එහි භව තණ්හාව යනු,
(1) ශාස්වත දෘෂ්ටිය මුල් කොටගෙන ඇති වන තණ්හාව ය.
(2) මරණින් මතු පැවැත්මක් නොපිළිගැනීම නිසා උපදින්නකි.
(3) භවයෙන් අත්මිදීමට ඇති ආසාව ය.
(4) මතු භවයේ දී විමුක්තිය ලබාගැනීමට ඇති කැමැත්ත ය.
(5) මෙලොව වශයෙන් පස්කම් සුව විඳීමට ඇති ගිජුකම ය.

33. දුක්ඛ නිරෝධාර්ය සත්‍යයෙන් ඉගැන්වෙනුයේ සසර දුකින් අත්මිදීම හෙවත් විමුක්තියයි, නිර්වාණයයි. පහත දැක්වෙන ධර්ම පාඨ අතුරෙන් එහි ස්වභාවය **නො කියවෙන්නේ** කුමකින් ද?
(1) "භව නිරෝධො නිබ්බානං"
(2) "එසොයෙව දුක්ඛස්සන්තො"
(3) "තණ්හක්ඛයොති නිබ්බානං"
(4) "යායං තණ්හා පොනො භවිකා"
(5) "නිබ්බානං පරමං සුඛං"

34. බුදුරජාණන් වහන්සේ විසින් දම්සක් පැවැතුම් සූත්‍රයේ දී "හීන ය, ග්‍රාම්‍ය ය, පුහුදුන් ස්වභාව ඇත්තේ ය, අනාර්ය ය, අවැඩදායක" යැ'යි දක්වමින් බැහැර කළ අන්තගාමී පිළිවෙතට මිනිසුන් යොමු වන්නේ,
(1) භව දෘෂ්ටිය නිසා ය.
(2) ආත්මවාදය පිළිගැනීමෙනි.
(3) උච්ඡේද දෘෂ්ටිය මුල් කොටගෙන ය.
(4) පෙර කළ කර්මය අනුව ය.
(5) නියතිවාදී අදහස් නිසා ය.

35. තණ්හාව නිසා සෙවීම ද, සෙවීම නිසා ලැබීම ද, ලැබීම නිසා විනිශ්චය ද ආදී වශයෙන් සිදු වන හේතුප්‍රත්‍යාකාර වූ මානව ක්‍රියාදාමය තුළින් සමාජයෙහි සාමය බිඳවැටී විවිධ ගැටුම් ඇති වන බව පෙන්වා දෙන බුද්ධ දේශනාව වන්නේ,
(1) කලහවිවාද සූත්‍රයයි.
(2) මහානිදාන සූත්‍රයයි.
(3) බ්‍රහ්මජාල සූත්‍රයයි.
(4) මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රයයි.
(5) චක්කවත්තිසීහනාද සූත්‍රයයි.

36. බුදුදහම මිනිසා සතු කායික ශක්තිය ගැන මෙන් ම මානසික ශක්තිය ගැන ද විවිධ කරුණු අපට උගන්වයි. එකී උභය ශක්තිය ම අගය කරයි. ඒ අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි **නො වන්නේ,**
(1) "කාය ශක්තිය මෙහෙයවීමෙන් සැපවත් ජීවිතයක් ගත කළ හැකි ය" යන්නයි.
(2) "මානසික ශක්තිය උසස් වුව ද එය පිරිහී යා හැකි ය" යන්නයි.
(3) "කාය ශක්තියෙන් ලබන භෞතික දියුණුව අගය කළ නොහැකි ය" යන්නයි.
(4) "දියුණු කිරීමෙන් බොහෝ වැඩ සිදු වන අසිරිමත් ශක්තිය ඇත්තේ මනසට ය" යන්නයි
(5) "බුද්ධාදී උතුමෝ මානසික ශක්තිය වර්ධනය කොට සියලු විජයග්‍රහණ ලබා ගත්හ" යන්නයි.

37. බුදුදහම මානව ශක්‍යතාව අගය කරයි. මිනිසකුට මෙලොව, පරලොව සහ සසර සියලු ගැටලු විසඳා ගන්නට හැකි බව පිළිගනියි. ඒ සඳහා මිනිසුන් පොලඹවන බුද්ධ දේශනාවක් ලෙස සැලකිය හැක්කේ කුමක් ද?
(1) "ආරභථ, නික්ඛමථ, යුඤ්ජථ, බුද්ධ සාසනෙ"
(2) "ඉධනන්දති පෙච්ච නන්දති"
(3) "පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨං"
(4) "සබ්බ පාපස්ස අකරණං"
(5) "සද්ධීධවිත්තං පුරිසස්ස සෙට්ඨං"

38. මේ කය කේසාන්තයේ සිට පාදාන්තය දක්වා කෙස්, ලොම්, නිය, දත් ආදී දෙතිස් කුණපයකින් සමන්විත ය. එබැවින් අසාර ය, පිළිකුල් සහගත යැ'යි කය පිළිබඳ ඇල්ම දුරු කිරීමට උගන්වන්නේ,
(1) මරණානුස්සති භාවනාවයි.
(2) අසුභානුස්සති භාවනාවයි.
(3) චිත්තානුපස්සනා භාවනාවයි.
(4) මෛත්‍රී භාවනාවයි.
(5) ඉන්ද්‍රිය භාවනාවයි.

39. යම් ක්‍රියාවක් අකුසලයක් හෝ කුසලයක් වන්නේ කවර කරුණු අනුව දැ'යි බුදුදහම පෙන්වා දෙයි. එම කරුණු හැඳින්වෙන්නේ කුසලාකුසල කර්ම නිශ්චය කිරීමේ බෞද්ධ මිනුම් දඬු යනුවෙනි. එවැන්නක් **නො වන්නේ** කුමක් ද?
(1) ක්‍රියාවක මානසික පදනම ය.
(2) සමාජ සම්මතය ය.
(3) තමන් උපමා කොට බැලීම ය.
(4) ධර්මය අනුව සලකා බැලීම ය.
(5) තමා මෙන් ම අනුන් ගැන ද සිතා බැලීම ය.

40. සමථ භාවනාවේ ප්‍රතිඵල වශයෙන් යෝගාවචරයකුට උපදවා ගත හැකි සුවිශේෂ ඥානාධිගම හෙවත් ලෞකික අභිඥා පහක් පාලි සූත්‍රවල සඳහන් වේ. එයින් ප්‍රාසාදයක උඩුමහලේ සිට එහි පිවිසෙන ඉන් පිටවෙන සත්වයන් දකින්නා සේ කර්මානුරූප ව චුති උප්පත්ති දැකීමේ ඥානය හඳුන්වා ඇත්තේ,
(1) ඉද්ධිවිධ ඥානය යනුවෙනි.
(2) ආසයානුසය ඥානය යනුවෙනි.
(3) ඉන්ද්‍රිය පරෝපරියත්ති ඥානය යනුවෙනි.
(4) විපස්සනා ඥානය යනුවෙනි.
(5) දිබ්බචක්ඛු ඥානය යනුවෙනි.

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**41.** බෞද්ධ සද්ධාව ඇතැම් සමය සම්ප්‍රදායවල උගන්වන භක්තිය හෝ ප්‍රේමය නො වේ. හුදු පැහැදීම හෝ අන්ධ විශ්වාසය ද නො වේ. ඒ පිළිබඳ නිවැරදි නිර්වචනය නම්,
(1) "තමන් කරන ඕනෑම යහපත් ක්‍රියාවක් පැහැදීමෙන් කිරීම සද්ධාව ය" යන්නයි.
(2) "නිවන් මග ගමන් කරන්නාට අදාළ වන්නේ සද්ධාව නොව ප්‍රඥාව ය" යන්නයි.
(3) "තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය පිළිගැනීම සද්ධාව ය" යන්නයි.
(4) "අමූලිකා සද්ධාව බුදුදහමේ අගය කර තිබේ" යන්නයි.
(5) "ධර්මය තර්කානුකූලව තේරුම් ගැනීම සද්ධාව ය" යන්නයි.

**42.** දීඝ නිකායේ බ්‍රහ්මජාල, සාමඤ්ඤඵල ආදී සූත්‍රවල සීල ප්‍රභේද තුනක් දැක්වේ. ඒ චූල සීල, මජ්ඣිම සීල හා මහා සීල යනුවෙනි. එහි චූල සීලයට අයත් ආජීව අට්ඨමක සීලයෙහි විශේෂත්වය නම්,
(1) රන්රිදී, මසුකහවනු නොපිළිගැනීමයි. (2) විකාල භෝජනයෙන් වැළකීමයි.
(3) කාමමිථ්‍යාචාරයෙන් තොරවීමයි. (4) මිච්ඡා ආජීවයෙන් වැළකී සිටීමයි.
(5) මල් ගඳ විළවුන් නොදැරීමයි.

**43.** විවේකාශ්‍රම විහාරයෙහි පසුගිය පුන්පොහෝදා පැවැති විශේෂ ධර්ම දේශනාවට වැඩම කළ ස්වාමීන් වහන්සේ උපොසථ අෂ්ටාංග ශීලය ආරක්ෂා කිරීමෙන් නිවනට තුඩු දෙන මූලික ගුණධර්ම දෙකක් ප්‍රගුණ වන බව පෙන්වා දුන්හ. එනම්,
(1) දානය හා පරිත්‍යාගයයි. (2) පින්දීම හා අනුමෝදන් වීමයි. (3) ඉවසීම හා අධිෂ්ඨානයයි.
(4) පවින් වැළකීම හා අපිස් පැවැත්මයි. (5) සමථය හා විපස්සනාවයි.

**44.** හොඳ නරක ඉගැන්වීමේ දී බුදුදහම භාවිත කර ඇත්තේ කුසල-අකුසල පුඤ්ඤ-පාප ආදී යෙදුම් ය. කුසල-පුඤ්ඤ යන දෙකින් ම හොඳ ක්‍රියාව කියැ වේ. කුසලයේ සුවිශේෂ බව **නො කියවෙන්නේ**,
(1) අකුසල් නොවන්නේ කුසල් ය යන්නෙනි.
(2) සසර සැප ලැබීමට කුසල් කළ යුතු ය යන්නෙනි.
(3) නූපන් කුසල් ඉපදවීම සම්මා වායාම ය යන්නෙනි.
(4) කුසල් සිත් වැඩීම භාවනාව ය යන්නෙනි.
(5) බුද්ධාදි රහතුන් අකුසල් දුරු කළ කුසල් ඇති උතුමන් ය යන්නෙනි.

**45.** සතර අප්පමඤ්ඤා නමින් ද හැඳින්වෙන සිවුබඹ විහරණ බුදුදහමේ එන කේන්ද්‍රීය සාරධර්ම වන්නේ ය. එහි මුදිතා යන්නෙන් කියැවෙන්නේ,
(1) අනුන්ගේ සැපත දැක එයට ඊර්ෂ්‍යා නොකර සතුටට පත්වීමයි.
(2) මොළොක් සිතුවිලි ඇති බවයි.
(3) කාරුණික ව ක්‍රියා කිරීමයි.
(4) මිතුරු සිතයි.
(5) සානුකම්පික සිතුවිල්ලයි.

**46.** බුදුදහම පුද්ගලයාට සිය ආර්ථිකය සුරක්ෂිත කර ගැනීමට මෙන් ම සමාජ ජීවිතය සාර්ථක කර ගැනීමට ද උගන්වයි. එම ඉගැන්වීම් දෙක ම ඇතුළත් **නො වන** සූත්‍ර දේශනාවක් වන්නේ,
(1) සිගාල සූත්‍රයයි. (2) පත්තකම්ම සූත්‍රයයි. (3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.
(4) රාසියගාමිණී සූත්‍රයයි. (5) මූලපරියාය සූත්‍රයයි.

**47.** ධාර්මික ව උපයා ගත් ධන සම්පත් ඇත්තෙකු වීම මිනිසෙකුට සැපත කැ'යි පිළිගන්නා බුදුදහම අවම සම්පත් ඇති බව දුක කැ'යි පෙන්වා දෙයි. ඒ බව කියැවෙන ධර්ම පාඨය නම්,
(1) "සන්තුට්ඨී පරමං ධනං" යන්නයි. (2) "දාලිද්දියං භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං" යන්නයි.
(3) "හමරස්සෙව ඉරීයතෙ" යන්නයි. (4) "උට්ඨාතා වින්දතෙ ධනං" යන්නයි.
(5) "ද්විහි කම්මං පයොජයෙ" යන්නයි.

**48.** බුදුදහම අනුව ආර්ථිකය හා සදාචාරය අතර ඇත්තේ අන්‍යෝන්‍ය බලපෑමකි. ආර්ථිකය බිඳ වැටීමෙන් සදාචාරය ද, සදාචාරය බිඳ වැටීමෙන් ආර්ථිකය ද බිඳ වැටේ. මෙම කරුණු දෙකින් එකක් හෝ සඳහන් **නො වන** බුද්ධ දේශනාව නම්,
(1) දම්සක් පැවැතුම් සූත්‍රයයි. (2) චක්කවත්ති සීහනාද සූත්‍රයයි. (3) ධම්මික සූත්‍රයයි.
(4) සිගාල සූත්‍රයයි. (5) අණන සූත්‍රයයි.

**49.** රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ ව විචාරකයෝ විවිධ මත ඉදිරිපත් කරති. ඒ පිළිබඳ බෞද්ධ මතය දැක්වෙන්නේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි ය. එහි **නො කියවෙන** කරුණක් වන්නේ,
(1) රජකම දේව වරමක් නොවේ යන්නයි.
(2) රජකම පියපුතු පරපුරෙන් උරුම වේ යන්නයි.
(3) රජු බිහිවන්නේ ජනසම්මතයෙනි යන්නයි.
(4) රජු සාමය රකිනු ඇත යනු ජනතා අපේක්ෂාවය යන්නයි.
(5) අයබදු ගැනීමේ බලය මහජනයා රජුට දී ඇත යන්නයි.

**50.** පැරණි ලක්දිව රජකම් කළ එක් පාලකයෙක් බෞද්ධ ප්‍රතිපත්ති ආරක්ෂා කරන බව කියා සිටි නමුදු පාරම්පරික පූජනීය ස්ථාන ආරක්ෂා කිරීමට පියවර නොගත්තේ ය. ඔහු විසින් කඩකොට ඇත්තේ,
(1) රාජධර්මයෙකි. (2) සක්විතිවතෙකි. (3) අපරිහානීය ධර්මයෙකි.
(4) සංග්‍රහ වස්තුවෙකි. (5) පඤ්ච ශීලයයි.

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

බුද්ධ ධර්මය II
பௌத்தம் II
Buddhism II

**41 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) අනාත්ම ධර්මය ඉගැන්වෙන සූත්‍රයක් නම් කරන්න.
   (ii) 'අත්තදීපා භික්ඛවෙ විහරථ' යන්නෙහි සරල අර්ථය ලියන්න.
   (iii) 'ඔපනයිකො' යන්න පැහැදිලි කරන්න.
   (iv) සතරමහාපදේශ හඳුන්වන්න.
   (v) "බුදුදහම මෙලොව දියුණුව ද අගයයි." විමසන්න. (ලකුණු 20යි.)

2. (i) සතර පාරාජිකා නම් කරන්න.
   (ii) 'සාමණේර' යන්න හඳුන්වන්න.
   (iii) ආරාමප්‍රතිග්‍රහණය පිළිබඳ පුවත පැහැදිලි කරන්න.
   (iv) සාංඝික දේපළ ක්‍රමය සැකෙවින් දක්වන්න.
   (v) විනය කර්මයක විශේෂතා **දෙකක්** විමසුමට ලක් කරන්න. (ලකුණු 20යි.)

3. (i) ඛේමා තෙරණියට හිමි වූ ශාසනික තනතුර නම් කරන්න.
   (ii) 'ජාතරූපරජතපටිග්ගහන' යන්නෙහි අර්ථය දක්වන්න.
   (iii) සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු අනඳ හිමියන්ට ඉදිරිපත් වූ චෝදනා පැහැදිලි කරන්න.
   (iv) අගසවු තනතුරු පත් කිරීමේ පුවත විස්තර කරන්න.
   (v) කථාවත්ථුප්පකරණය පිළිබඳ කෙටි විමසුමක් කරන්න. (ලකුණු 20යි.)

## II කොටස

4. (i) ආශ්‍රම ධර්ම පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් කරන්න.
   (ii) ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

5. (i) අග්ගඤ්ඤ සූත්‍රය අනුව 'සන්නිධිකාරපරිභෝගය' හඳුන්වන්න.
   (ii) එය සමාජ පරිණාමයට තුඩු දුන් ආකාරය විමසන්න. (ලකුණු 20යි.)

6. (i) පටිච්චසමුප්පාදයේ මූලික අරමුණු පෙන්වා දෙන්න.
   (ii) "අවිජ්ජා පච්චයා සංඛාරා" ධර්මානුකූලව පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

7. (i) බෞද්ධ ශ්‍රද්ධාවේ සුවිශේෂතා පෙන්වා දෙන්න.
   (ii) නිවන්මග තුළ ශ්‍රද්ධාවට හිමි තැන සාකච්ඡා කරන්න. (ලකුණු 20යි.)

8. (i) 'සමජීවිකතා' යන්න විස්තර කරන්න.
   (ii) ආර්ථිකය හා රාජ්‍ය පාලනය අතර ඇති සම්බන්ධය බුද්ධ දේශනා ඇසුරෙන් විමසන්න. (ලකුණු 20යි.)

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka